*සැ. යු.* - (i) 2022.09.09 වැනි දින පළ වූ 2297 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2022 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,298- 2022 සැප්තැම්බර් මස 16 වැනි සිකුරාදා - 2022.09.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 204 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | 205 |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |

*සැ. යු.* - (i) යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.
(ii) උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ඔක්තෝබර් මස 07 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 සැප්තැම්බර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

203 - B 082382- 353 (2022/09)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් චතුරංග ගුණසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්ති යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.08.18 දින ප්‍රදානය කර ඇති අංක (2)/ගා/8/ප්‍ර/20078 හා එල්. එල්. 64663 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකාරිය වන ගණේගොඩ පදිංචි තනිප්පුල්ලිගේ අගස්තිනා වෙත ප්‍රදානය කොට බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 1562 යටතේ 1995.11.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.10.14 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ බෙන්තර වළල්ලාවිට නැගෙනහිර කෝරළේ ඇල්පිටිය උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කැටපලවත්ත (ගනේගොඩ) නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක 08/50 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි මු. පි. ගා. 2074 දරන පිඹුරේ අංක 25 දරන කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.093 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : කැටපොලවත්ත.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 65, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 22, 65, |
| *දකුණට* | : | කැබලි අංක 26, 22, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 65, 26. |

චතුරංග ගුණසේකර,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්පිටිය.

2021 දෙසැම්බර් මස 28 වැනි දින.

09-178/1

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් චතුරංග ගුණසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්ති යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.05.19 වැනි දින ප්‍රදානය කර ඇති අංක ගාප්‍ර/10366 හා එල්. එල්. 51844 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකාරිය වන ගණේගොඩ පදිංචි පිටිගල කංකානම්ගේ රොසලින් නන්දාවතී වෙත ප්‍රදානය කොට බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 174 යටතේ 1988.04.08 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.10.14 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෙන්තර වළල්ලාවිට නැගෙනහිර කෝරළේ ඇල්පිටිය උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගනේගොඩ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු. පි. ගා. 2074 දරන පිඹුරේ අංක 106 දරන කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.106ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : කැටපොලවත්ත.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම පිඹුරේ කැබලි අක 95, |
| *නැගෙනහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 95 හා 105, |
| *දකුණට* | : | මෙම පිඹුරේ කැබලි අංක 105 හා 114, |
| *බස්නාහිරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 114. |

චතුරංග ගුණසේකර,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්පිටිය.

2021 දෙසැම්බර් මස 28 වැනි දින.

09-178/2

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/70013.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : UPLC/L/26/KG/L/ 141.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මොනරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 146 ඩී කරවිලේ ග්‍රාම නිලධාරි වසමේ, මයිලගම ගමෙහි පිහිටි අ. භූ. පි. 25 හි ජනපද නිළධාරි විසින් අඳින ලද අංක COM/197 දරන දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 03 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල වාණිජ කටයුත්තක් සඳහා අනුග්‍රාහක පදනමින් උඩුව විදානලාගේ සුනිල් ප්‍රේමචන්ද්‍ර මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | මැණික් ගඟ රක්ෂිතය, |
| නැගෙනහිරට | : | සේපාල රාජපක්ෂගේ ඉඩම, |
| දකුණට | : | සේපාල රාජපක්ෂගේ ඉඩම සහ පාර රක්ෂිතය, |
| බටහිරට | : | ධනසිරි අමරතුංගගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය*.- අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2022.07.07 වැනි දින සිට).

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

වාර මුදල. - වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු එකක් (01) ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2022.07.07 වැනි දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 සැප්තැම්බර් මස 05 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-167

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/60760.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : MWC/LND/CROWN/ L1/11.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 358, ඔයාමඩුව ග්‍රාම නිලධාරි වසමේ, ඔයාමඩුව ගමේ

අ. භූ. පි. 2 හි කැබලි අංක 3206 සහ අවසාන ගම් පිඹුරු අංක 741 හි කොටසක් ද, ඇතුළත් පිඹුරු අංක 1060 කැබලි අංක 01 දැක්වෙන දළ අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 5.0712 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා හේරත් මුදියන්සේලාගේ රවීන්ද්‍ර දේවප්‍රිය ගුණවර්ධන මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | අ. භූ. පි. 02 හි කැබලි අංක 385 සහ අ. ග. පි. 741, |
| නැගෙනහිරට | : | අ. ග. පි. 741 සහ අ. භූ. පි. 02 හි කැබලි අංක 387, |
| දකුණට | : | අ. භූ. පි. 02 හි කැබලි අංක 387, 3205 සහ 3204 |
| බටහිරට | : | අ. භූ. පි. 02 හි කැබලි අංක 3204 සහ 385. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2022.04.01 වැනි දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල.*- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2022 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2022 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු එකක් (01) ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2022.04.01 වැනි දින සිට වසර 05 ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(උ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 අගෝස්තු මස 26 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-179

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.